# (33) ඉතිහාසය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

I පත්‍රය - කාලය පැය 01යි. මුළු ලකුණු 80යි.
බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි. **10 ශ්‍රේණිය සඳහා 50%ක්** ද, **11 ශ්‍රේණිය සඳහා 50%ක්** ද, වශයෙන් බර තැබෙන ආකාරයට ප්‍රශ්න සකස් කරන අතර ඒ තුළ **80%ක් ශ්‍රී ලංකා ඉතිහාසය** සම්බන්ධ නිපුණතා සඳහා ද, **20%ක් ලෝක ඉතිහාසය** හා සම්බන්ධ නිපුණතා සඳහා ද බර තැබේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 80යි.

II පත්‍රය - කාලය පැය 03යි. මුළු ලකුණු 120යි.
මෙය I, II හා III වශයෙන් ප්‍රධාන කොටස් 3කින් යුක්ත ය.

I කොටස

පළමුවන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. එහි A හා B වශයෙන් කොටස් දෙකකි.

A කොටස - සිතියම් ලකුණු කිරීම - ලකුණු 18යි.

B කොටස - පින්තූර ආශ්‍රිත/ ඓතිහාසික සිද්ධි ආශ්‍රිත කෙටි ප්‍රශ්න හතරකින් සමන්විත ය. ලකුණු 12යි.

II කොටස

ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 6කින් සමන්විත ය. ඉන් 4 කට පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්න 6 නිපුණතා මට්ටම්වලට වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාවට අනුකූලව පහත පාඩම් ඒකකවලින් සකස් කෙරේ.

**10 ශ්‍රේණිය - 1, 2, 3, 4, 5, 6, 7, 8, 10**

**11 ශ්‍රේණිය - 2, 3, 4, 5, 6** ලකුණු $18 \times 4 = 72$

III කොටස

ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 2කින් සමන්විත ය. ඉන් එකකට පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්න දෙක නිපුණතා මට්ටම්වලට වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාවට අනුකූල ව පහත පාඩම් ඒකකවලින් සකස් කෙරේ.

**10 ශ්‍රේණිය - 9**

**11 ශ්‍රේණිය - 1, 7, 8** ලකුණු $18 \times 1 = 18$

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | | | |
|---|---|---|---|---|
| I පත්‍රය | = | 80 | | |
| II පත්‍රය | = | 120 | | |
| අවසාන ලකුණ | = | 200 ÷ 2 | = | 100 |

## (33) ඉතිහාසය

### I පත්‍රය

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න. (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

**1.** ශ්‍රී ලංකාවේ පැරණිතම වංසකථාව ලෙස සැලකෙනුයේ මින් කවරක් ද?

(1) මහාවංසය (2) දීපවංසය (3) බෝධිවංසය (4) ධාතුවංසය

**2.** මෙරට ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු හැදෑරීමේ දී මූලාශ්‍රයක් වශයෙන් වැදගත් වන්නේ කුමක් ද?

(1) වංස කථා (2) ශිලා මෙවලම්
(3) ශිලා ලිපි (4) ගොඩනැගිලිවල නටබුන්

**3.** පහත දැක්වෙන තොරතුරු අතුරින් පූර්ව ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ මානව කටයුතුවල මූලික වෙනස්කමක් ඇති වීමට තුඩු දුන් සාධකය කුමක් ද?

(1) යකඩ භාවිතය ආරම්භ වීම
(2) ආහාර සඳහා සතුන් දඩයම් කිරීම
(3) පදිංචිය සඳහා ගල්ගුහා යොදා ගැනීම
(4) ආහාර පුළුස්සා අනුභව කිරීම

**4.** පැරණි ශිලා ලිපිවල ''ගමික'' යනුවෙන් හඳුන්වා ඇත්තේ කවුරුන් ද?

(1) පවුලක ප්‍රධානියා ය. (2) වැව් පද්ධතියක ප්‍රධානියා ය.
(3) ගෝත්‍රයක ප්‍රධානියා ය. (4) ගමක ප්‍රධානියා ය.

**5.** භාතිකාභය රාජ්‍ය සමයේ දී මෙරටට පබළු ගෙන් වූ බව සඳහන් වන්නේ කවර රටකින් ද?

(1) රෝමය (2) චීනය (3) ඉන්දියාව (4) ග්‍රීසිය

**6.** ශ්‍රී ලංකාවේ මුල්වරට විශාල වැව් තැන වූ පාලකයා කවරෙක් ද?

(1) සද්ධාතිස්ස රජතුමා (2) වසභ රජතුමා (3) මහසෙන් රජතුමා (4) ධාතුසේන රජතුමා

**7.** අතීතයේ දී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස වැදගත් වීමට හේතු වූ **ප්‍රධානතම** කරුණ මින් කුමක් ද?

(1) පෙර-අපර දෙදිග වෙළෙඳ මාර්ගයේ මධ්‍යගතව පිහිටීම
(2) දකුණු ඉන්දියාවට ආසන්නව පිහිටීම
(3) රට වටා ස්වභාවික වරායන් පිහිටීම
(4) ඉන්දියානු සාගරය තුළ දූපතක්ව පිහිටීම

**8.** ''කැතිඅඩ'' නමින් හැඳින් වූ බද්ද අය කරන ලද්දේ මින් කවරකින් ද?

(1) පුද්ගලික වැව්වලින් (2) ගෙවතුවලින්
(3) කුඹුරුවලින් (4) හේන්වලින්

**9.** ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩමවන ලද්දේ කුමන වරාය ඔස්සේ ද?

(1) මහාතිත්ථ (2) ජම්බුකෝළ පට්ටන
(3) ගෝකණ්ණ (4) ගොඩවාය

**10.** ''වර්තමාන මාදුරු ඔය ජලාශය සඳහා සොරොව්වක් ඉදි කිරීමට තෝරා ගත් ස්ථානයේ ම පැරණි සොරොව්වක නටබුන් මතු වී ඇත''. මින් හෙළිවන වැදගත්ම තොරතුර වන්නේ,

(1) සොරොව්වක් නිර්මාණයේ දී එකම නිර්මාණ ද්‍රව්‍ය යොදා ගෙන ඇති බව ය.
(2) මිනුම් කටයුතු පිළිබඳ ශිල්පීය ක්‍රම එකම ආකාරයක පැවති බව ය.
(3) අතීත වාරි තාක්ෂණය පිළිබඳ දැනුම ඉතා උසස් මට්ටමක පැවති බව ය.
(4) අතීතයේ දී ද සොරොව්ව ආශ්‍රිතව පැරණි ජලාශයක් තිබූ බව ය.

**11.** වේගයෙන් හමන සුළංධාරා උපයෝගී කර ගනිමින් යපස් උණු කිරීමේ තාක්ෂණය අතීතයේ දී පැවති බවට සාධක ලැබෙන ස්ථානයක් වන්නේ,

(1) සමනළ වැව (2) බෙරගල (3) අලකොළ වැව (4) අලිගල

**12.** පළමුවන පරාක්‍රමබාහු රජතුමා තමා උපන් ස්ථානයේ තැන වූ ස්තූපය හැඳින්වෙන්නේ,

(1) යුධගනාව ස්තූපය නමිනි. (2) අභයගිරිය නමිනි.
(3) සුතිඝර චෛත්‍යය නමිනි. (4) දෙමළ මහ සෑය නමිනි.

**13.** විශාල වැවක වැව් බැම්මට ඇති වන පීඩනය පාලනය කොට ප්‍රධාන ඇළ මාර්ගයට ජලය නිකුත් කිරීම සඳහා පැරණි වාරි ශිල්පීන් යොදාගත් තාක්ෂණික ක්‍රමය වූයේ,

(1) රළපනාව තැනවීම ය. (2) පිටවාන ඉදි කිරීම ය.
(3) ගොඩ සොරොව්ව තැනවීම ය. (4) බිසෝකොටුව ඉදි කිරීම ය.

**14.** අතීතයේ දී ද මෙරට දියුණු විදේශ වෙළෙඳාමක් පැවති බව පෙන්වන සාධකයක් වන්නේ,

(1) රට පුරා ව්‍යාප්ත වූ ජනාවාස රටාවක් තිබීම ය.
(2) ජනාවාස සම්බන්ධ කෙරෙමින් තැනූ මාර්ග පද්ධතියක් තිබීම ය.
(3) ප්‍රධාන නගරවල විදේශ වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටා තිබීම ය.
(4) ප්‍රධාන ගංගා ආශ්‍රිතව තොටුපළ නගර රාශියක් පිහිටා තිබීම ය.

**15.** අතීතයේ දී ''කලඳ'' වශයෙන් හැඳින්වූයේ,

(1) දුර මැනීමේ ඒකකයකි. (2) කාලය මැනීමේ ඒකකයකි.
(3) දියර මැනීමේ ඒකකයකි. (4) බර මැනීමේ ඒකකයකි.

**16.** පොළොන්නරු රාජධානිය බිඳවැටීමට බලපෑ ආසන්නතම හේතුව වූයේ,

(1) කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලයක් ඇති වීම ය.
(2) කාලිංග මාඝගේ ආක්‍රමණය ය.
(3) දුර්වල පාලකයන් බලයට පත්වීම ය.
(4) රාජරාජ නම් චෝළ අධිරාජයා මෙරට ආක්‍රමණය කිරීම ය.

**17.** පළමුවන විමලධර්මසූරිය රජතුමා මුහුණ දුන් අභියෝගයක් **නොවන්නේ,**

(1) උඩරට රාජ්‍යය පෘතුගීසීන්ගෙන් රැකගත යුතු වීම ය.
(2) උඩරට රාජ්‍යය සීතාවක බලපෑමෙන් මුදා ගතයුතු වීම ය.
(3) උඩරට රාජ්‍යය ලන්දේසීන්ගෙන් රැක ගත යුතු වීම ය.
(4) උඩරට රාජ්‍යයේ ආර්ථිකය දියුණු කළ යුතු වීම ය.

**18.** පහත සඳහන් කාර්යයන් අතරින් මහනුවර රාජ්‍ය සමයේ රජුට අයත් කාර්යයන් දැක්වෙන පිළිතුර තෝරන්න.

A - සම්ප්‍රදායට හා පෙර සිරිතට අනුව කටයුතු කිරීම
B - වැරදිකරුවන්ට මරණීය දණ්ඩනය පැනවීම
C - දළදා මාළිගාවේ ගිහි භාරකරු වීම
D - සියලු ම නඩු විසඳිය යුතු වීම

(1) A හා B (2) B හා D (3) A හා C (4) C හා D

**19.** නව මුහුදු මාර්ග සෙවීමේ කටයුතු සාර්ථක කර ගැනීමට සුදුසු පරිසරයක් පුනරුද සමය වන විට ගොඩනැගී තිබිණ. එයට ප්‍රධාන වශයෙන් බලපෑ කරුණු ඇතුළත් පිළිතුර වන්නේ,

A - මාලිමා යන්ත්‍රය හා උතුරු තරු මාපකය නිපදවා ගැනීම
B - ලෝකය ගෝලාකාර බව ඔප්පු වීම
C - මෙම ගමන් සඳහා ප්‍රාදේශීය පාලකයන්ගේ අනුග්‍රහය ලැබීම
D - සිතියම් විද්‍යාවේ දියුණුව නිසා ලෝකය පිළිබඳ අවබෝධය පුළුල් වීම

(1) A, B හා C (2) B, C හා D (3) C, D හා A (4) A, B හා D

**20.** පෘතුගීසීන් යාපනය රාජධානිය යටත් කර ගැනීමට උනන්දු වූයේ පහත සඳහන් කවර කරුණු නිසා ද?

A - මුළු දිවයිනේම කුළුබඩු ඒකාධිකාරය ලබා ගැනීමට
B - උතුරු ප්‍රදේශයෙන් වරායක් ලබා ගැනීමට
C - යාපන ප්‍රදේශයේ කතෝලික ආගම් ප්‍රචාරයට පැමිණි බාධක ඉවත් කිරීම
D - යාපනය හා උඩරට පාලකයින් අතර පැවති සම්බන්ධතා වැළැක්වීමට

(1) A හා B (2) B හා C (3) C හා D (4) A හා C

- **පහත දක්වා ඇති නිපැයුම් අධ්‍යයනය කොට 21 සහ 22 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - දුවන නඩාව
B - ආරක්ෂක ලාම්පුව
C - මැකඩම් ක්‍රමය
D - මියුල් යන්ත්‍රය
E - වාෂ්ප එන්ජිම

**21.** ඉහත දක්වා ඇති ඒවා අතුරින් පේෂ කර්මාන්තය හා සම්බන්ධ නිපැයුම් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A හා C (2) B හා E (3) C හා D (4) A හා D

**22.** ඉහත දැක්වෙන ඒවායින් ගල් අඟුරු කර්මාන්තය හා සම්බන්ධ නිපැයුම් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A හා C (2) B හා E (3) C හා D (4) A හා D

**23.** ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍ය අවධානය යොමු වීමට බලපෑ ප්‍රධාන ම සාධකය වූයේ,

(1) ඉන්දියාවේ මෝගල් පාලනය දුර්වල කිරීමට හැකි වීම ය.
(2) ඉන්දියාව අවට මුහුදු කලාපයේ වෙළෙඳ කටයුතු පාලනය කිරීමට හැකි වීම ය.
(3) ඉන්දියානු සාගරයේ නාවික කටයුතු හැසිරවීමට පහසු වීම ය.
(4) වතු වගාව සඳහා ඉඩම් ලබා ගැනීමට හැකි වීම ය.

- **පහත සඳහන් වගුවේ A සිට J දක්වා තොරතුරු ඇසුරින් 24 සහ 25 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| වර්ෂය | බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයෝ | ඓතිහාසික පුද්ගලයෝ |
|---|---|---|
| A 1815<br>B 1848<br>C 1803 | D ෆ්‍රෙඩ්රික් නෝර්ත්<br>E රොබට් බ්‍රවුන්රිග්<br>F ටොරින්ටන් සාමි | G මුත්තුසාමි<br>H පුරන් අප්පු<br>J ශ්‍රී වික්‍රම රාජසිංහ රජු |

**24.** බ්‍රිතාන්‍යයන් උඩරට යටත් කිරීම පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A E J (2) A F J (3) A D H (4) B E G

**25.** උඩරට යටත් වීමෙන් පසු බ්‍රිතාන්‍යයන්ට එරෙහිව සිදුවූ සටනක් පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) C F H (2) B F H (3) A F H (4) B F G

- **පහත වගුවේ සඳහන් A සිට J දක්වා තොරතුරු ඇසුරින් 26 සහ 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| නායකයෝ | මුද්‍රිත ප්‍රකාශන | පාසල් |
|---|---|---|
| A ආරුමුග නාවලර් තුමා | D සරසවි සඳරැස | G කොළඹ සහිරා විද්‍යාලය |
| B හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා | E මුස්ලිම් නේසන් | H වන්නාර් පන්නෙයි ශෛව ප්‍රකාශ විද්‍යාසාලෙයි |
| C එම්.සී. සිද්දි ලෙබ්බේ මහතා | F උදයභාණු | J කොළඹ ආනන්ද විද්‍යාලය |

**26.** බෞද්ධ පුනරුද ව්‍යාපාරය පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A D G (2) B D J (3) C F J (4) B F J

**27.** හින්දු පුනරුද ව්‍යාපාරය පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A E H (2) C F G (3) B E J (4) A F H

- **කොල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණලවල කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. එම තොරතුරු ආශ්‍රයෙන් 28 සහ 29 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටු වීම
B - උඩරට හා පහත රට පළාත් සඳහා ඒකාබද්ධ වූ පාලන ක්‍රමයක් හඳුන්වා දීම
C - නව අධිකරණ පද්ධතියක් හඳුන්වා දීම
D - අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
E - රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම

**28.** ඉහත සඳහන් ලක්ෂණවලින් දේශපාලන ක්ෂේත්‍රයේ ඇති කරන ලද ප්‍රතිසංස්කරණ වශයෙන් දැක්විය හැක්කේ මොනවා ද?

(1) A හා B (2) A හා D (3) C හා D (4) D හා E

**29.** ඉහත සඳහන් ප්‍රතිසංස්කරණ යටතේ ආර්ථික ක්ෂේත්‍රයේ ඇති කරන ලද වෙනස්කම් වශයෙන් දැක්විය හැක්කේ මොනවා ද?

(1) A හා B (2) C හා D (3) D හා E (4) A හා C

- **ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය නිසා හට ගත් ප්‍රතිඵල කිහිපයක් පහත දැක්වේ. ඒවා අධ්‍යයනය කොට 30 සහ 31 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - මධ්‍යම පන්තියක් බිහි වීම
B - අපනයන වැවිලි බෝග හඳුන්වා දීම
C - බටහිර සිරිත් විරිත් රට තුළ ප්‍රචලිත වීම
D - කම්කරු පංතියක් බිහි වීම
E - ඉංග්‍රීසි අධ්‍යාපනය හඳුන්වා දීම

**30.** බ්‍රිතාන්‍ය පාලනය නිසා හට ගත් සමාජ වෙනස්කම් දෙකක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B (2) B හා C (3) D හා E (4) A හා D

**31.** මෙරට සංස්කෘතියේ වෙනස්කම් ඇති වීම කෙරෙහි බලපෑ ප්‍රධාන කරුණු දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා C (2) B හා D (3) C හා E (4) A හා E

- **32, 33, සහ 34 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරා, එයට හිමි අංකය පිළිතුරු පත්‍රයේ ලකුණු කරන්න.**

**32.** සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ එංගලන්ත කිරීටය නියෝජනය වීම පිණිස ........................................ තනතුර ස්ථාපනය කෙරිණි.

(1) ආණ්ඩුකාරවරයා (2) අග්‍රාණ්ඩුකාරවරයා (3) අගමැතිවරයා (4) කතානායකවරයා

**33.** 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ........................................ ශ්‍රී ලංකාවේ ප්‍රථම නාමික විධායක ජනාධිපති තනතුරට පත් විය.

(1) ජේ.ආර්. ජයවර්ධන මහතා (2) විලියම් ගොපල්ලව මහතා
(3) ආර්. ප්‍රේමදාස මහතා (4) ඩී.බී. විජේතුංග මහතා

**34.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් අධිකරණ පද්ධතිය අනුව .................................................. දිවයිනේ උත්තරීතර හා අවසාන අධිකරණ බලය හිමි ආයතනය වේ.

(1) අභියාචනාධිකරණය (2) මහාධිකරණය (3) දිසා අධිකරණය (4) ශ්‍රේෂ්ඨාධිකරණය

- **පහත A, B, C සහ D යටතේ දැක්වෙන ප්‍රකාශ යුගලයන් අධ්‍යයනය කර 35, 36 සහ 37 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. සෝල්බරි ආණ්ඩුක්‍රමය
2. පාර්ලිමේන්තු ක්‍රමය

B - 1. දේශපාලන පක්ෂ ක්‍රමය
2. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය

C - 1. ව්‍යවස්ථාදායකය
2. නීති පැනවීම

D - 1. මූලික මිනිස් අයිතිවාසිකම්
2. විධායක ජනාධිපති

**35.** පළමු වැන්නේ වර්ධනය දෙවැන්න සාර්ථක වීමට බලපාන යුගලය
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**36.** පළමු වැන්න හා දෙවැන්න අතර සබඳතාවක් නොපෙන්වන යුගලය
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**37.** දෙවැන්නේ ක්‍රියාකාරිත්වයට පළමුවැන්න අත්‍යවශ්‍ය වන යුගලය
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

- **පහත A හා B ප්‍රකාශ කියවා 38 සහ 39 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - තේ පෙට්ටි මුහුදට විසි කිරීම B - බැස්ටීල් නම් බන්ධනාගාරයට පහර දීම
මෙම ප්‍රකාශ අතුරින්,

**38.** ඇමෙරිකානු නිදහස් සටන හා සම්බන්ධයෙන්,

(1) A සත්‍ය වන අතර, B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර, B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

**39.** ප්‍රංශ විප්ලවය හා සම්බන්ධයෙන්,
(1) A සත්‍ය වන අතර, B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර, B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

**40.** A හා B ප්‍රකාශ කියවා පහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.
A - ප්‍රාන්ස් පර්ඩිනන්ඩ් කුමරු ඝාතනය කිරීම B - ජර්මනියේ හිට්ලර්ගේ ක්‍රියාකලාපය
දෙවන ලෝක යුද්ධය ආරම්භ වීම සම්බන්ධයෙන්

(1) A සත්‍ය වන අතර, B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර, B සත්‍ය වේ.
(3) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වේ. (4) A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය වේ.

* * *

# (33) ඉතිහාසය

### II පත්‍රය

**සැලකිය යුතුයි :**

* **I** කොටසේ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **II** කොටසින් ප්‍රශ්න **හතරක්** ද, **III** කොටසින් **එක් ප්‍රශ්නයක්** ද, බැගින් තෝරාගෙන ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

---

### I කොටස

**1.** (අ) පහත **(i)** යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම**, සපයා ඇති **ශ්‍රී ලංකා** සිතියමෙහි ද **(ii)** යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම**, සපයා ඇති **ලෝක** සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) වලවේ ගඟ, ජම්බුකෝල පට්ටන, පල්ලවංක, මහියංගණය, අනුරාධපුර, සීගිරිය, කන්තලේ වැව, ගම්පොල, දේව නගර, ගාල්ල, හලාවත, හෝර්ටන් තැන්න (ලකුණු 12යි)

(ii) කොන්ස්තන්තිනෝපල්, වැනීසිය, කැලිකට්, පිලිපීන් දූපත්, සූවස් ඇළ, සිංගප්පූරුව (ලකුණු 06යි)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන්, අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - මින්නේරි දෙවියන් ලෙස රජරට වැසියන්ගේ ගෞරවාදරයට පත් වූ රජතුමා

B - දෙවන රාජසිංහ රජතුමාගේ සිරකරුවෙකු ලෙස සිට උඩරට රාජ්‍යය පිළිබඳ ග්‍රන්ථයක් රචනා කළ ඉංග්‍රීසි ජාතිකයා

C - ගම්පොල රාජ්‍ය සමයේ දී මෙරට ආක්‍රමණය කළ චීන සේනාධිපතියා

D - ප්‍රංශ විප්ලව සමයේ දී රාජ්‍ය පාලනයට බලපෑම් කළ දහසයවන ලුවී රජුගේ බිසව

(ලකුණු 04යි)

* A සහ B යටතේ දක්වා ඇති පිංතූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.


(ii) 1. 'A' වලින් දක්වා ඇති ස්ථානයේ නම කුමක් ද?
2. මෙහි සිට පාලනය ගෙන ගිය පාලකයා කවරෙක් ද?
3. මෙහි ඇති ලෝ පතල කලා නිර්මාණය කුමක් ද?
4. මෙම ස්ථානය නැරඹූ අය තම අදහස් සටහන් කර ඇති ප්‍රාකාරය නම් කරන්න.



A රූපය

(ලකුණු 04යි)

(iii) 1. 'B' වලින් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
2. මෙතුමා කුමන ජාතිකයෙක් ද?
3. මෙතුමාගේ මූලිකත්වයෙන් වර්ෂ 1880 දී පිහිටුවන ලද සංවිධානය කුමක් ද?
4. මෙතුමාගේ මූලිකත්වයෙන් කොළඹ පිහිටුවන ලද පාසල කුමක් ද?



B රූපය

(ලකුණු 04යි)

## II කොටස

**2.** (i) ප්‍රාග් ඓතිහාසික මානවයා තම වාසස්ථාන තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ කරුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ii) (a) ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාර පිණිස දඩයම් කළ සතුන් දෙවර්ගයක් නම් කරන්න.

(b) ඔවුන් භාවිතා කළ ශාකමය ආහාර දෙවර්ගයක් නම් කරන්න. (ලකුණු 04යි)

(iii) ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජනාවාස පිහිටුවීමට තුඩු දුන් සාධක **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05යි)

(iv) ඓතිහාසික යුගයේ දී මෙරට කෘෂිකර්මය ක්‍රියාත්මක වූ ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 06යි)

**3.** (i) පහත සඳහන් එක් එක් කාර්යය සඳහා පැරණි ලංකාවේ ක්‍රියාත්මක වූ බදු වර්ගය කුමක්දැ යි පිළිවෙළින් ලියා දක්වන්න.

A - රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද

B - ඇළ මාර්ගවල මත්ස්‍යයින් ඇල්ලීම වෙනුවෙන් රජය අය කළ බද්ද

C - වැව්වල ජලය වගා කටයුතු සඳහා භාවිතා කරන්නන්ගෙන් අය කළ බද්ද (ලකුණු 03යි)

(ii) හෝපිටිගමුව වෙළෙඳපොළේ පාලන කටයුතු සම්බන්ධයෙන් පනවා තිබූ වැදගත් නීති **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) පැරණි ශ්‍රී ලංකාවේ පැවති කර්මාන්ත දෙකක් පිළිබඳ නිදසුන් **දෙකක්** සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iv) පැරැන්නන්ගේ ආහාර වර්ගවල විවිධත්වයක් පැවති බව ඔවුන් භාවිත කළ ආහාර ඇසුරින් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**4.** (i) පහත සඳහන් වැව් කරවන ලද රජවරුන් කවුරුන්දැ යි අනුපිළිවෙළින් දක්වන්න.

A - අභය වැව

B - තිසා වැව

C - කලා වැව (ලකුණු 03යි)

(ii) පැරණි කාලයේ දී දිග මැනීමට භාවිත කළ මිමි **දෙකක්** නම් කරන්න. (ලකුණු 04යි)

(iii) අපේ පැරැන්නන් පරිසරය ආරක්ෂා කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iv) පැරණි වාරි තාක්ෂණයේ විශිෂ්ටත්වය, වැව් හා ඇළ මාර්ග තැනවීම ඇසුරින් උදාහරණ **දෙකක්** සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**5.** (i) ශ්‍රී ලංකාවේ පළමුවන නාගරීකරණ යුගයට අයත් පාලන මධ්‍යස්ථාන **දෙකක් ද**, දෙවන නාගරීකරණ යුගයට අයත් පාලන මධ්‍යස්ථාන **එකක් ද** නම් කරන්න. (ලකුණු 03යි)

(ii) පළමුවන නාගරීකරණ යුගයට අයත් අවසන් පාලන මධ්‍යස්ථානය බිඳ වැටීමට හේතු වූ කරුණු **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04යි)

(iii) ශ්‍රී ලංකාවේ දෙවන නාගරීකරණ මධ්‍යස්ථාන වශයෙන් තෙත් කලාපීය ස්ථානයන් තෝරා ගැනීමට පදනම් වූ කරුණු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05යි)

(iv) දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලන හා සාහිත්‍ය සේවාවන් විස්තර කරන්න. (ලකුණු 06යි)

**6.** (i) උඩරට රජවරුන් හමුවීමට පැමිණි ඉංග්‍රිසි දූතයන් **තිදෙනා** නම් කරන්න. (ලකුණු 03යි)

(ii) වර්ෂ 1803 දී ඉංග්‍රීසින්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ හේතු **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04යි)

(iii) 1818 දී නිදහස් අරගලයට බලපෑ හේතු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iv) 1848 දී ඉංග්‍රීසි විරෝධී සටනට කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ හේතු වූ ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 06යි)

**7.** (i) පහත A, B හා C වලින් දැක්වෙන එක් එක් ආයතන පිහිටුවන ලද්දේ කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින්දැ යි අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - ව්‍යවස්ථාදායක සභාව

B - රාජ්‍ය මන්ත්‍රණ සභාව

C - ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව (ලකුණු 03යි)

(ii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ බ්‍රිතාන්‍ය රාජ්‍ය නිලධාරීන් යටතේ පැවති විෂය ක්ෂේත්‍ර **දෙකක්** ද, ශ්‍රී ලාංකික අමාත්‍යවරුන් යටතේ පැවති විෂය ක්ෂේත්‍ර **දෙකක්** ද නම් කරන්න. (ලකුණු 04යි)

(iii) වතු බෝග වගාව නිසා මෙරට ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iv) වර්ෂ 1931න් පසුව මෙරට වී නිෂ්පාදනය දියුණු කිරීම සඳහා රජය අනුගමනය කළ ක්‍රියා මාර්ග **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06යි)

## III කොටස

**8.** (i) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවයක් ආරම්භ වීමට මුල් වූ ප්‍රධාන කර්මාන්ත **තුන** නම් කරන්න. (ලකුණු 03යි)

(ii) බ්‍රිතාන්‍යයෙන් ඇරඹුන කාර්මික විප්ලවය 19 සියවසේ දී වෙනත් යුරෝපා රටවලට ව්‍යාප්ත වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) කාර්මික විප්ලවය නිසා ප්‍රවාහන ක්ෂේත්‍රයේ හටගත් දියුණුව කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05යි)

(iv) කාර්මික විප්ලවය නිසා ලෝකයේ,

(a) දේශපාලන (b) ආර්ථික

යන ක්ෂේත්‍රවල හටගත් වෙනස්කම් **එක** බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**9.** (i) පහත A, B හා C යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පිළිතුරු දක්වන්න.

A - කුඩා ප්‍රාන්ත එකතුකොට එක්සත් ජර්මනියක් බිහි කළ පුද්ගලයා

B - පළමුවන ලෝක සංග්‍රාමයෙන් පරාජිත ජර්මනියට දඬුවම් පැමිණ වූ ගිවිසුම

C - පළමු වන ලෝක සංග්‍රාමයෙන් පසුව ජර්මනියේ පිහිටු වූ නව ආණ්ඩුක්‍රමයේ නම (ලකුණු 03යි)

(ii) පහත A, B, C හා D යටතේ දැක්වෙන එක් එක් කරුණට අදාළ පිළිතුර අනුපිළිවෙළින් දක්වන්න.

A - ජර්මනිය විසින් 1870 දී බලහත්කාරයෙන් අත්පත් කර ගත් ප්‍රංශය සතු වූ ගල් අඟුරු හා යපස් බහුල ප්‍රදේශය

B - පළමුවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව සාමය රැක ගැනීම සඳහා පිහිටවා ගත් සංවිධානය

C - ඇමෙරිකා එක්සත් ජනපදය දෙවන ලෝක මහා යුද්ධයට සම්බන්ධ වීමට බලපෑ ආසන්නතම හේතුව


D - දෙවන ලෝක මහා සංග්‍රාමයේ දී ජපානය යටත් වීමට තීරණය කිරීමට බලපෑ හේතුව (ලකුණු 04යි)

(iii) ''දෙවන ලෝක මහා සංග්‍රාමය මෙතෙක් මිහිපිට ඇති වූ මහත් විනාශයක් ලඟා කර දුන් යුද්ධයයි''. මේ බව නිදසුන් **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iv) දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ලෝක දේශපාලනය වෙනස් වූ ආකාරය නිදසුන් සපයමින් විස්තර කරන්න. (ලකුණු 06යි)

* * *

**1.** (අ) (i)



1. (අ) (ii)

